කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ද්විතීය පරීක්ෂණය (බාහිර) - 2011
2012 දෙසැම්බර් / 2013 ජනවාරි

සමාජීය විද්‍යා පීඨය

පුස්තකාල හා විඥාපන විද්‍යාව - LISC - E 2015

ග්‍රන්ථ විඥාපන පාලනය, සුචිකරණ න්‍යාය හා පරිචය

පළමුවන ප්‍රශ්නය ඇතුළුව මුළු ප්‍රශ්න හතරකට (04) පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 07 යි. කාලය : පැය 03 යි.

---

01. **අනිවාර්ය ප්‍රශ්නය**

පහත දක්වෙන ග්‍රන්ථ විස්තරය සඳහා වර්ගීකෘත සුචියකට අදාල සියලු සංලේඛ සම්පාදනය කරන්න.

ශ්‍රී ලාංකේය සමාජය හා සංස්කෘතිය පාඨනය කිරීම: තෝරාගත් නිබන්ධ (තෙවන වෙලුම: 2000-2500) / සංස්කරණය හා සම්පාදනය සසංක පෙරේරා, හරින්ද්‍ර දසනායක/ සහය සංස්කරණය චන්ද්‍ර ලේකම්ආරච්චි / සමාජ සංස්කෘතික තීව්‍ර අධ්‍යයනය සඳහා වන කොළඹ ආයතනය, 119 A, කින්සි පාර, කොළඹ 08/ 2007 / ISBN 955-1493-04-4/ උස සන්ටිමීටර් 21/ පිටු 405 / චිත්‍ර සහිතයි/ මිල රු. 950

(ලකුණු 20)

02. විවිධ ප්‍රවේශන මාර්ග ඔස්සේ (Access Points) පුස්තකාල පොත් වෙත පිවිසීමට ඉඩ සැලැස්වීම සෑම පුස්තකාල සුචියකම මූලික අරමුණක් වෙයි. පත්‍රිකා සුචියක දී භාවිත කරනු ලබන විවිධ ප්‍රවේශන මාර්ග නිදසුන් දෙමින් විස්තර කරන්න.

03. සී. ඒ. කටර් විසින් නිර්මාණය කළ ආකාරාදී සුචියක් සඳහා වන නීති සංග්‍රහය (Rules for Dictionary Catalogue) **හෝ** එස්. ආර්. රංගනාදන් විසින් නිර්මාණය කළ වර්ගීකෘත සුචියක් සඳහා වන නීති සංග්‍රහය (Classified Catalogue Code - CCC) හෝ පිළිබඳව විචාර පූර්වක අධ්‍යයනයක යෙදෙන්න.

(ලකුණු 20)

04. ''ඕනෑම පුස්තකාල සුචියක ඒකීයත්වය ඇතිකිරීමට සාධිකාරී පාලනය (Authority Control) වැදගත් වේ.''

1. සාධිකාරී පාලනය යනු කුමක්ද? හඳුන්වන්න. (ලකුණු 08)

11. සුචිය තුළ කර්තෘ හා ග්‍රන්ථනාම සාධිකාරී පාලනයක් ඇතිකිරීම සඳහා ඈංග්ලෝ ඇමරිකානු සුචිකරණ නීති සංග්‍රහයේ දෙවන සංස්කරණය ($AACR_2$) තුළ භාවිත නීති පිළිබඳ විස්තර කරන්න.

(ලකුණු 12)

05. කෘතියකට ආයතන කර්තෘත්වය හිමි වන්නේ කුමන අවස්ථාවලදී ද? ආයතන කර්තෘත්වයේ විවිධ අවස්ථා විස්තර කරන්න.

06. 1. ග්‍රන්ථ විද්‍යාත්මක විස්තරයක් යනුවෙන් ඔබ අදහස් කරන්නේ කුමක්ද? ඔබ හදාරා ඇති ග්‍රන්ථ විද්‍යාත්මක විස්තර ප්‍රමිති තුනක් (03) නම් කරන්න.

(ලකුණු 06)

11. ජාත්‍යන්තර පොදු ග්‍රන්ථ විද්‍යාත්මක විස්තරය (ISBD (G))අනුව කෘතියක් විස්තර කිරීමේ දී සලකා බැලෙන ප්‍රධාන ක්ෂේත්‍ර එම ක්ෂේත්‍රවල අනු කොටස් හා විරාම ලක්ෂණ කවරේ දැයි නිදසුන් සහිතව විස්තර කරන්න.

(ලකුණු 14)

07. පහත අවස්ථා අතරින් **හතරක් (04)** පමණක් පිළිබඳ ප්‍රමාණාත්මක විස්තර හා උදාහරණ දක්වමින් කෙටි විස්තරයක් සපයන්න.

i. ඒකීය ග්‍රන්ථ නාම

ii. මිශ්‍ර කර්තෘ

iii. මාලික ප්‍රකාශන සුචිකරණය

iv. කොංග්‍රස් පුස්තකාලීය විෂය ශීර්ෂ ලැයිස්තුව

v. ග්‍රන්ථ විඥාපන පාලනය

**********************************